**IPRC/16/229**

# ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරිත්වය (කැස්බෑව නගර සභාව කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්)

එච්.ඊ.එන්. ප්‍රියදර්ශනි[1*]

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පදනම ශක්තිමත් වන්නේ යහපාලනය තුළිනි. යහපාලන සංකල්පය ලෝකයේ දියුණු දේශපාලන භාවිතාවක් ලෙස සාකච්ඡාවට බඳුන්වන සංකල්පයකි. රජයේ පොදු ආයතන, පොදු කටයුතු මෙහෙයවා ක්‍රියාත්මක කිරීම, මහජන සම්පත් කළමනාකරණය, මහජනතාවගේ සංවර්ධන කටයුතු, මිනිසාගේ ආරක්ෂාව ඇතුළු සියලුම මානව අයිතිවාසිකම් සහතික කරන ක්‍රියාකාරිත්වය රාජ්‍ය පාලනය වේ. මෙකී පාලන බලය සහභාගිත්වය, නීතියේ ආධිපත්‍ය, විනිවිදභාව, ප්‍රතිචාරාත්මක බව, සම්මුති පාදකවීම , සමානාත්මතාවය , කාර්යක්ෂමතාවය , වගවීම යන ලක්ෂණ සහිත යහපාලනයක් රාජ්‍ය පාලනය තුළ පවත්වාගෙන යා යුතු ය. වර්තමානය වන විට ලාංකික සමාජය වසර ගණනාවක් පැවති යුද්ධයේ ප්‍රතිඵල, දේශපාලන පොරොන්දු කඩවීම්, අල්ලස හා දූෂණය, අයිතිවාසිකම් උල්ලංඝණය, දිනෙන් දින වැඩිවන වංචා, යනා දී අර්බුදයන්ට මුහුණ පා සිටී. විශේෂයෙන්ම යහපාලන සංකල්පය ප්‍රාදේශීය ආණ්ඩු තුළට කොතෙක් දුරට ගළපාගෙන පවතී ද සහ ඒ හරහා ජාතික දේශපාලනය ශක්තිමත් කිරීමට ලබා දී ඇති දායකත්වය විමසා බැලීම ඉතා වැදගත් වේ. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ ලෙසට ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාත්මක භාවය අධ්‍යයනය හා සෙසු අරමුණු ලෙසට ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ නිලධාරින්ගේ සහ මහජන නියෝජිතයින්ගේ කාර්යභාරය අධ්‍යයනය, ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ ප්‍රතිපත්ති තීරණය හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය අධ්‍යයනය යනාදිය දැක්විය හැක. පර්යේෂණයේ ගැටලුව ලෙසට යහපාලන සංකල්පය ප්‍රාදේශීය ආණ්ඩුකරණයට ඇතුළත් කර තිබුණ ද එම සංකල්පයෙන් බලාපොරොත්තු වන නිශ්චිත ඉලක්ක කරා ප්‍රායෝගිකව ළඟා වී නැත්තේ ඇයි යන්න ලෙස සකසා මෙම පර්යේෂණය සිදුකරන ලදි. අධ්‍යයන ක්‍රමවේදය ලෙසට ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත භාවිතා කළ අතර දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් සිදුකරන ලදි. ඒ සඳහා පරිගණක මෘදුකාංග භාවිතා කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල ලෙසට දේශපාලනීකරණය තදින් ක්‍රියාත්මක වීම, ජනතා සහභාගීත්වය දුරස්ථ මට්ටමක පැවතීම, අකාර්යක්ෂමතාවය වේ. පර්යේෂණයේ සීමාවන් ලෙසට සමස්තය ගෙන අධ්‍යයනය කිරීමේ අපහසුතාවය නිසාවෙන් පාලන තන්ත්‍රයේ එක් කොටසක් පමණක් ගෙන අධ්‍යයනය, පක්ෂග්‍රාහීවීම් හා කාලය වැනි සීමාවලට නතුවිය. විශේෂයෙන් ප්‍රාදේශීය ආණ්ඩු කටයුතු වල දී ගනු ලබන ප්‍රතිපත්ති, තීන්දු තීරණ වලදීත් ඒවා ක්‍රියාත්මක කිරිමේදීත් ජනතාවගේ, නියෝජිතයින්ගේ සහ නිලධාරීන්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. මෙහි දී ජනතා සහභාගීත්වය දුරස්ථ මට්ටමක පවතින විට ඒ තුළ දේශපාලනීකරණය තදින් ක්‍රියාත්මක වීම, ජාතික තලයේ ප්‍රතිපත්ති සම්පාදන ආයතන විසින් කලින් කලට පනවනු ලබන නීතිවලට අනුගත වෙමින් පාලනය ගෙනයාමට ප්‍රාදේශීය නියෝජිතයන්ට සිදුව ඇත. මෙම කාරණා හේතුවෙන් යහපාලනයක් පවත්වා ගෙන යාම දුර්වල මට්ටමක පවතී යනුවෙන් නිගමනය කොට දැක්විය හැකිය.

***ප්‍රමුඛ පද:*** *යහපාලනය, ප්‍රාදේශීය ආණ්ඩුකරණය, ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා සහභාගිත්වය, අයිතිවාසිකම්.*

[1] ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. *nilupriyadarshani120@gmail.com